(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක **41**.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2022 ජුනි 22** බදාදා **පූ.භා. 10.00** ට

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **ටිරාන් අලස් මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **නසීර් අහමඩ් මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **මනූෂ නානායක්කාර මහතා,** කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **ධම්මික පෙරේරා මහතා,** ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා

ගරු **නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රොෂාන් රණසිංහ මහතා,** වාරිමාර්ග අමාත්‍යතුමා සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා සහ ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

---

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **දිලුම් අමුණුගම මහතා**

ගරු **තවරාජා කලෙයි අරසන් මහතා**

ගරු **ලසන්ත අලගියවන්න මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **තිසකුට්ටි ආරච්චි මහතා**

ගරු **යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා**

ගරු **(ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා**

ගරු **සංජීව එදිරිමාන්න මහතා**

ගරු **අකිල එල්ලාවල මහතා**

ගරු **ලලිත් එල්ලාවල මහතා**

ගරු **සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**

ගරු **සාගර කාරියවසම් මහතා**

ගරු **ෆයිසාල් කාසිම් මහතා**

ගරු **ජයන්ත කැටගොඩ මහතා**

ගරු **උදයන කිරිඳිගොඩ මහතා**

ගරු **ලලිත් වර්ණ කුමාර මහතා**

ගරු **ගෙවිඳු කුමාරතුංග මහතා**

ගරු **කේ. පී. එස්. කුමාරසිරි මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **කරුණාදාස කොඩිතුවක්කු මහතා**

ගරු **සිරිපාල ගමලත් මහතා**

ගරු **උදය ගම්මන්පිල මහතා**

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ජීවන් තොන්ඩමන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු විමලවීර දිසානායක මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු වමල් රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු මධුර විතානගේ මහතා

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

**ගරු තේනුක විදානගමගේ මහතා**

**ගරු විමල් වීරවංශ මහතා**

**ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා**

**ගරු ඩී. වීරසිංහ මහතා**

**ගරු වීරසුමන වීරසිංහ මහතා**

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**ගරු ජගත් සමරවික්‍රම මහතා**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු ඩී. බී. හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. අභිනව මන්ත්‍රීවරයන්ගේ නිල ප්‍රතිඥාදීම හෝ දිවුරුම්දීම:** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ තෝරා පත්කර ගන්නා ලද පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු කුලප්පු ආරච්චිගේ දොන් ධම්මික පෙරේරා මහතා නීති ප්‍රකාර ප්‍රතිඥා දී සභා මේසය මත තබා ඇති පොතෙහි අත්සන් කළේය.

**2. ජනාධිපතිවරයාගෙන් ලැබෙන සංදේශ:** ජනාධිපතිවරයාගෙන් ලද මතු පළවන සංදේශය කථානායකවරයා විසින් කියවන ලදී:—

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
**President of Sri Lanka**

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/12/7

2022 ජුනි මස 20 වන දින

**ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

[signature]

**ගෝඨාභය රාජපක්ෂ**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

**3. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර එම වාර්තාව, ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින්—

(i) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 මැයි 31 දිනැති අංක 2282/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි; සහ

(ii) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 මැයි 31 දිනැති අංක 2282/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි

පිළිගන්වන ලදී.

එම රෙගුලාසි රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2022 ජූනි 20 දිනැති අංක 2285/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරමින් කරන ලද ප්‍රකාශනය ඉදිරිපත් කරන ලදී.

එම ලේඛනය, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(5) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින්—

(i) 2021 වර්ෂය සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2021 වර්ෂය සඳහා නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(6) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා වරාය හා නාවික අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(7) ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(8) වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීතිරීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ සභාපති, ගරු දිනේෂ් ගුණවර්ධන මහතා විසින් එම විශේෂ කාරක සභාවේ වාර්තාව සහ කාර්ය සටහන් ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව සහ කාර්ය සටහන්, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**5. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

කුණ්ඩසාලේ, පල්ලේකැලේ, ජනසවිගම, අංක 155 දරන ස්ථානයෙහි පදිංචි විතානගේ ගෙදර දයාරත්න මහතාගෙන් ලැබුණු 2021.10.10 දිනැති පෙත්සම ගරු දිලුම් අමුණුගම මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**6. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,—පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2022 ජනවාරි 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 4.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.00ට ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 4.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,—පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2022 ජූලි 04 සඳුදා පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8.පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,—පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද,

2022 ජූලි 04 සඳුදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 3.30 දක්වා ද විය යුතු ය. අ.භා. 3.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9.පාර්ලිමේන්තුවේ වැඩකටයුතු:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2022 ජූලි 04 සඳුදා පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න පිළිබඳ වැඩකටයුතු පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 35හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10.පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 4):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2022 ජූලි 04 සඳුදා පූ.භා. 10.00 වන තෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. කල් තැබීම (ඖෂධ හිඟය සහ සෞඛ්‍ය ක්ෂේත්‍රය මුහුණපාන ගැටලු):** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

(අ.භා.12.46 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

"ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි සෞඛ්‍ය අමාත්‍ය සහ ජල සම්පාදන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.01 ට ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා.3.27 ට නියෝජ්‍ය කථානායකරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය; අ.භා 4.14 ට නියෝජ්‍ය කථානායකරයා විසින් අද දින සභා සම්මතිය අනුව, 2022 ජූලි 04 සඳුදා පූ. භා. 10.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් තබන ලදී.